සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

71 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................

# සිංහල I

කාලය පැය තුනයි

- ❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- ❖ **පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.**

01. **පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(අ) උයිත් දණ්ඩක් පතක් කපාගන්ට නිසි යකඩයක් හැරගෙන දඬුපත් බලා අවිදිනෝ තුඹසක් පිට සිටි කැලයක් දැක දණ්ඩක් පතක් කපන්ට වන්හ. ඒ කපන සොල්මනට තුඹසින් නයෙක් අවුත්ලා දඬු කපන තැනැත්ත වු කාපීය. එවේලෙහි ම මරාලු ගසෙක වැදගත් ගින්නක් මෙන් දෂ්ටමුඛයේ පටන් විෂය නැගීලා ලේගුණය නැතිවලා ගත නිල් ව ගොසින් මිය වැටී ගියේ ය. සිටු දුවණියෝ ද මහදුක් විඳිමින් දඬු කපා ගිය තැනැත්තවුන් නගන ගෙවල් තබා උන් තමනුන් නොලැබ අනෙක් පුතණු කෙනෙකුන් වදාපූ ය. දරුවෝ දෙන්න සුළං ශීත ඉවසා ගත නොහී හඩති. සිටු දියණියෝ ද දරුවන් දෙන්නා බඩතුරෙහි ලා ගෙන දෙදණත් දෙවැලමිටත් බිම ඔබාලා නැඹුරු ව ගෙන සිට තුන්යම් රාත්‍රිය ගෙවාපීය.

(i) 'තුඹසින් නයෙක් අවුත්ලා' මෙහි 'තුඹසින්' යන්නෙහි ව්‍යාකරණ ලක්ෂණ දක්වන්න.
(ii) මෙම පුද්ගලයා වනයට ගියේ ඇයි?
(iii) මොහු මිය ගොස් සිටියේ කෙසේ ද?
(iv) 'මරාලු ගසෙක' , 'බඩතුරෙහි ලා ගෙන' යන වචනවලට අර්ථ සපයන්න. (ලකුණු 4යි)

(ආ) මම තොප කෙරෙහි ප්‍රසන්නයෙමි. ප්‍රසන්න වූ මම එක් මලණු කෙනෙකුන් තොපට දෙමි. කවුරුන් ගෙනෙම්දැ'යි කීය. ඒ අසා බෝධිසත්වයෝ ''බාල මලණුවන් ගෙනෙව'යි කිවූ ය. දිය රකුසු කියන්නේ ''පණ්ඩිතයෙනි, තෙපි උදක් දේව ධර්මය දන්නා පමණක් ම ය. එ පමණක් විනා ඒ ධර්මයෙහි තොප පවත්නේ නැතැයි කීය. 'කවර කාරණයකින් දැ' යි කී කල්හි වැඩිමහලු තැනැත්තන් තබා බාල තැනැත්තන් ගෙන්වන හෙයින් තොප ජෙට්ඨාපචායන කර්මය නො කරන හෙයිනැ' යි කීය. එබස් අසා මහ බෝසතාණෝ කියන්නෝ! එම්බල යක්ෂය, මම දේවධර්මයත් දනිමි. දේව ධර්මයෙහිත් පවතිමි. අපි මේ වලට වදනමෝ මේ බාල මලණුවන් නිසා වනුම් හ. මුන් පිණිස අපගේ පියාණන් වහන්සේගේ අතින් මුන්ගේ මෑණියෝ රාජ්‍ය ඉල්වූ ය. අපගේ පියාණන් වහන්සේ ඒ වරය නොදී අප රක්නා නිසා වනයෙහි වසන්නට කී සේක.

(i) දිය රකුසා එක් මලණු කෙනෙකුන් ලබා දීමට කැමැත්ත දැක්වූයේ ඇයි?
(ii) බෝධිසත්වයන් දේව ධර්මය ආරක්ෂා නොකරන බව දිය රකුසා පැවසීමට හේතුව දක්වන්න.
(iii) බාල මලණුවන්ගේ මෑණියන් පියරජුගෙන් ඉල්ලූ වරය කුමක් ද?
(iv) 'උදක්' 'වරය' යන වචනවලට අර්ථ සපයන්න. (ලකුණු 4යි)

(ඉ) මේ ලෝකයෙහි බොහෝ ධන ධාන්‍ය සම්පත් ඇති ව, සර්වාභරණයෙන් සැරහී ඇවිදුණේ වී නමුදු ඉදින් රෝගී වී නම් ඒ ඉතා නො හොබනේ ම ය. යම් ලෝකයෙහි නිර්ව්‍යාධි බව හා සමාන අන් කිසි ධන ධාන්‍යයෙක් නැතැ'යි කිසි ව්‍යාධියක් නැති නීරෝගී තැනැත්තේ හැම තැන්හි ම ශෝභාවත් ව බබළයි' කීහ. එතෙපුල් අසා රාජකුමාරයෝ සියළඟ සම්වැරලි ගත් මහලු මිනිසෙකු ගෙන්වා ගෙන ඔහුට යම්තම් කැඳිත්තක් පෙවූහ. ඒ මහලු ඇසිල්ලෙහි තරුණ පුරුෂයෙකු මෙන් විලිපිළි නැතිව ශෝභාවත් ව සිටගත. රාජකුමාරයෝ ද ඔහු දැක, මහත් වූ ආශ්චර්යයට පැමිණ දොළොස් දහසක් භික්ෂූන් වහන්සේට පාත්‍රා පුරා කැඳ දුන්හ. ඉක්බිති යම් ම ව්‍යාධියක් ඇති කෙනෙක් ඔවුන්ගේ මාළිගාවට විත් බෙහෙත් කැඳ ඉල්වාගෙන ඉන් ව්‍යාධි සංසිඳුවා ගනිති.

(i) ලෝකයේ පවත්නා වූ ධන ධාන්‍යවලට වඩා වැඩි වටිනාකමක් ඇති සම්පත්තිය කුමක් ද?
(ii) කැඳිත්තක් බීමෙන් තරුණ වූයේ කවුරුන් ද?
(iii) ව්‍යාධි ඇතිවුන් මාලිගාවට පැමිණියේ ඇයි?
(iv) 'ව්‍යාධි' හා ආශ්චර්යය' යන වචනවල අර්ථ දක්වන්න. (ලකුණු 4යි)

(ඊ)
විදා සිනිඳු සුදු රැස් දිගු පිය පතර
නඳා සුපුන් හිමකර පියකර තිසර
සඳා සිත'බ සියපත් නුබ තඹර'කර
උදා දෙසෙන් වැද එන රඟ බල මිතුර

වියත උදුල කිරණ'ව රළ පැහැ පැහැස
දිගත විසුළ සුර ගඟුලැලි දිසි විලස
දියත පතළ පිරිසිදු සඳ රැස් වෙසෙස
තනෙත පුරා දකු දැහැ ගතෙහි සරතස

(i) කවියා පවසන පරිදි අහස් ගඟේ දිය රැලි විවිධ දිශාවන්හි විසිරීමට හේතුව කුමක් ද?
(ii) ආකාශය උපමා කර ඇත්තේ කුමකට ද?
(iii) 'සුපුන් හිමකර' යන්නෙන් වෙසෙසා දැක්වෙනුයේ කුමක් ද?
(iv) 'උදා දෙසෙන්' , 'සරතස' වචනවල තේරුම් ලියන්න. (ලකුණු 4යි)

(උ) පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් ''හතරක'' අවස්ථා සම්බන්ධය දක්වන්න.
(i) '' දේවයන්වහන්ස, නුඹ වහන්සේ දරා ඉවසා සිටියෙමි.''
(ii) මෙතැනට එක්සිය අසූ ගවුවෙකින් ඔබ්බේ දෙවුරම් වෙහෙර වසන සේකැයි''
(iii) ''ගොළුවන් බිහිරන් සේ බැණ නො නැඟී හිඳුව' යි''
(iv) '' මේ පොත දැකල තියෙනව ද? මට පුස්තකාලයෙන් හම්බ වුණා''
(v) ''එන්ඩ, එන්ඩ නපුරී. දැන්වත් මට ආදරය දක්වන්ඩ''
(vi) ''මගෙත් ඉතින් ගේ දොර බලාගන්න යන්න එපායැ''? (ලකුණු 8 යි)

(ඉ)	පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

පඩි පෙළින් උඩගු කළ මහ ගෙදර ආලින්දෙ
ලී කුලුනු යා කරන ලීස්තර වැට මැදින්
නෙත් හෙළමි අදත් මම කුඩා දරුවෙකු ලෙසින්
පාළුවෙන් පුරන් වූ ඇත වෙල් එළිය වෙත

මෝස්තර කැටයමින් බැබළෙනා ලී පටි ද
අලුත් බීරළු සේ ම දිළෙන සැම දා සුද ද
වට කළේ ජීවිතය බෝධි කොටුවක් ලෙසින්
සැම දේ ම මා දුටුවෙ ලීස්තර වැට මැදින්

පාන ළඟ වැඳ වැටෙන අම්මාගෙ මුව මඬල
පසුපසින් පෙළ ගැසෙන නැගෙණියන්ගේ පිළිම
සැඳෑ එළියේ ඇඳෙන සංසාර සෙවණැල්ල
බලා සිටියෙමි තනි ව ලීස්තර වැට මැදින්

වසරකට වතාවක් පිළිසකර කර වැට ම
පාට ගෑවේ සුදට සාර්ලිස් බාස් විත්
මගේ සිත අලුත් වී ලීස්තර වැට සමඟ
අමුතු එළියක් වැටිණ එවිට මිදුලට සිතට

මා අවට ගලා ගිය ජීවිතය දෙස නිතර
සුදු ලීස්තර මැදින් බලා සිටියා මිසක
උස් පිලෙන් බිමට බැස ඒ දිවිය වෙත එළැඹ
වෙළෙන්නට ගැටෙන්නට හරස් විය මේ වැට ම

පාළුවෙන් පුරන් වූ ඇත වෙල් එළිය මෙන්
මගේ සිත පුරන් වී ඇත මෙදින ශෝකයෙන්
කොළ හැලුණු මිදුල මත නගා සර සර හඬක්
පාන් පැල ළඟට යන අම්මාගේ සේයාව
සැඳෑ එළියේ ඇඳෙන සංසාර සෙවණැල්ල
බලා සිටිනෙමි අදත් ලීස්තර වැට මැදින්

(ලකුණු 16යි)

02. ''සද්ධර්මරත්නාවලිය උසස් සාහිත්‍ය කෘතියක් වූයේ කතුවරයා භාවිත කළ රචනෝපක්‍රම නිසා ය.'' නියමිත කතා ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15යි)

නැතහොත්

''සර්වකාලීන අගයෙන් යුතු කෘතියක් ලෙස ජාතක පොත පාඨක සම්භාවනාවට පාත්‍ර වේ. නියමිත ජාතක කතා දෙකක් ඇසුරින් විමසන්න. (ලකුණු 15යි)

03. සාර සමාජයක් බිහි කිරීමෙහිලා පුද්ගල මනෝභාවයන් ප්‍රධාන වන බව සද්ධර්මාලංකාරයේ එන කතා තුළින් පැහැදිලි වේ. නිර්දිෂ්ට කතා ඇසුරින් විමසන්න.

(ලකුණු 15 යි)

04. අවස්ථෝචිතව චිරිත් වෙනස් කිරීමට ගිරා සංදේශකරුවා දක්වන ප්‍රතිභාව ගිරා සංදේශය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

05. ''මළගිය ඇත්තෝ නවකතාව කෙරෙහි පාඨකයා සමීප ව ඇත්තේ කාව්‍යමය බස් වහරට පමණක් සීමා නොවී ව්‍යවහාර භාෂා භාවිතය ද නිසාවෙනි.'' අවස්ථා හා සිද්ධි ඇසරෙන් විමසන්න.

(ලකුණු 15යි)

06. සමාජයේ විවිධ චරිතයන්ගේ ගුඪ හැසිරීම් රටාවල ස්වභාවය මැනවින් නිරූපණය කෙරෙන කෙටිකතාවක් ලෙස ''මාවතේ දරුවෝ' අගය කළ හැකිය. සාකච්ඡා කරන්න.

(ලකුණු 15යි)

07. දුක්ඛ දෝමනස්සයන්ගෙන් ගහණ වූ ජීවිතවල යථාර්ථය කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට නූතන කවීන් සමත් වී ඇති ආකාරය නූතන පද්‍ය සංග්‍රහයේ ඇතුළත් පද්‍ය පංති තුනක්වත් නිදසුන් කොට දක්වමින් පහදන්න.

(ලකුණු 15යි)

08. 'රත්නාවලී' නාට්‍ය රචනා කිරීමේදී නාට්‍යකරු ව්‍යක්ත භාෂා රීතියත් ව්‍යවහාර භාෂා රීතියත් යොදාගෙන තිබීම කෙතෙක් දුරට සාර්ථක වී තිබේ ද යන්න විමර්ශනය කරන්න.

(ලකුණු 15යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 71 | S | II |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018
## Second Term Test - Grade 13 - 2018

විභාග අංකය .............................     **සිංහල II**     කාලය පැය තුනයි

- I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ 2 හා 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- I ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට **වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන** එයට හිමි අංකය වරහන තුළ යොදන්න.

1.1 සන්ධ්‍යක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න
(1) ඉ, උ, එ, ඔ  (2) උ, ඌ, ඔ, ඖ  (3) එ, ඔ, ඓ, ඖ
(4) එ, ඔ, උ, ඖ  (5) ඓ, ඖ, ඉ, ඊ  (.....)

1.2 **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) ප්‍රවීණ, ප්‍රකාශනය, මාළිගාව, බිළිඳු, පරිමාණය
(2) ඌණ පූරණය, නිෂ්කර්ශන, නිරූපණ, නිදර්ශන, ග්‍රහණය
(3) ප්‍රස්තාවනාව, ව්‍යංගාර්ථ, සමස්ථ, පද්ධතිය, වීරෝදාර
(4) ප්‍රියම්භිකා, අන්‍යෝන්‍ය, භක්තිය, පාඨශාලාව, පුණ්‍ය
(5) දෘෂ්ටාන්ත, විෂ්කම්භය, නැළවිල්ල, වලාකුළ, ගැළපීම  (.....)

1.3 **අකාරාදී පිළිවෙළ අනුව** නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) මැකිගියදඩමං, වන සරණ, සුදුගෝණා, සුදු වැද්දා
(2) වජිරපබ්බත, කටු සහ මල්, රාජපක්ෂ වලව්ව, කාලොඅයංතෙ
(3) මේධා, චාරුමුඛ, වරදත්ත, කැකෑරිල්ල
(4) රතුම රතු, කරුමක්කාරයෝ, ගුරුළුවත, උයනක හිඳ ලියූ ගී
(5) පරසතුරෝ, ගැහැණු ළමයි, රතුරෝස, හතුරු හිතක්  (.....)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිරවද්‍ය ප්‍රකාශය** තෝරන්න.
(1) කර්තෘ විභක්තිය කාරයක් නොවේ.
(2) සම්බන්ධ විභක්තිය කාරකයක් නොවේ.
(3) ආලපන විභක්තිය කාරකයක් වේ.
(4) ප්‍රථමා විභක්තිය කාරකයක් නොවේ.
(5) විභක්ති නවය ම කාරක වේ.

1.5 **ගයනුකිත්ත, රකාරාංශය, රේඵය, හා යංශය** සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පේළිය තෝරන්න.
(1) දුර්භාග්‍ය, සෞන්දර්ය, ප්‍රකම්පන, වර්‍ණවත්
(2) මූර්ධය, අභිප්‍රේරණය, කෞශල්‍ය, ශ්‍රව්‍ය
(3) මෞර්ය, උපද්‍රව, ගර්‍භය, අමාත්‍යවරයා
(4) ප්‍රභාව, භෞතික, ආකර්‍මික, ලාවන්‍ය
(5) ලෞකික, ගර්‍භය, ක්‍රමවත්, කාව්‍ය  (.....)

1.6 **එකිනෙකට අනුරූප වන සේ** වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) දහම් දීපය, සම්භාව්‍ය සංගීතය, ආධුනික ශිල්පියා, නව ලෝකය
(2) අඳුරු ආකාශය, ප්‍රේත ලෝකය, ශෛල්‍ය වෛද්‍ය, මිත්‍යා ආකල්ප
(3) වානර සේනාව. ප්‍රබල ශක්තිය, දුර්ග මග, ආනන්ද ජවනිකා
(4) පූර්ව අම්බරය, සාහිත්‍ය කෘතිය, මාර්ග නීති, කාව්‍ය ශාස්ත්‍රය
(5) බුද්ධ පුත්‍ර, දිව්‍ය පුත්‍රයා, දේශීය වෙදකම, මෑතකාලීන (.....)

1.7 **තත්සම වචන පමණක්** අන්තර්ගත වරණය තොරන්න.

(1) චාලක, භෞමික, දකුණු, අඹර
(2) අක්ෂර, වර්ණ, ව්‍යඤ්ජන, ගතකුරු
(3) කෑදර, භීතිය, විලෝපීය, ශ්‍රමණ
(4) මින්දද, හුසුර, ඉඳුනිල්, චාමිකර
(5) පාලනය, යාත්‍රාව, සාමුද්‍රිකා, චන්දන (.....)

1.8 මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) භාග්‍යය - දුර්භාග්‍ය, සෞභාගය, අවාසනාව, අභාග්‍යය
(2) ප්‍රබල - දුබල, අබල, දුර්වල, බෙලහීන
(3) නිකසළ - කසළ, අපවිත්‍ර, අපිරිසිදු, අශුද්ධ
(4) අධම - උත්තම, උත්කෘෂ්ට, පවර, සඳ
(5) අසරණ - පිහිට, සරණ, උදව්, උපකාර (.....)

1.9 මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක් ඇතුළත්** නො වන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) දිනකර - පිනිපා, රැස්හිමි, පබාකර, රවි
(2) මහත් - තුමුල, විසල්, පෘථුල, නැඹුළු
(3) මැණික් - මිණි, මාණික්‍ය, රත්න, කනක
(4) අග්නි - නල, ජාතවේද, වහ්නි, අනල
(5) අරණ - බැද්ද, වන, වල, කැලෑව (.....)

1.10 **විශේෂණ පූර්ව පද, අන්‍යාර්ථ, සම්ප්‍රදාන විභක්ති, විශේෂණ අපරපද** යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) මහෞෂධපණ්ඩිත, බුදුකුරු, සුදුකොඩිය, බුද්ධපූජා
(2) බුදුකුරු, බුද්ධපූජා, සුදුකොඩිය, මහෞෂධපණ්ඩිත
(3) සුදුකොටිය, බුදුකුරු, බුද්ධපූජා. මහෞෂධපණ්ඩිත
(4) බුද්ධපූජා, බුදුකුරු, මහෞෂධපණ්ඩිත, සුදුකොඩිය
(5) සුදුකොඩිය, බුදුකුරු, මහෞෂධපණ්ඩිත, බුද්ධපූජා (.....)

1.11 **කෘදන්ත පදයක් අන්තර්ගත නො වන** වරණය තෝරන්න.

(1) යන්නේ, එන්නේ, නගින්නේ, සොයන්නේ
(2) කැපෙන, දිවෙන, යැවෙන, නැගෙන
(3) සොයන්නා, හඬන්නා. දුවන්නා, සිතන්නා
(4) වපුට, උපුට, නකුට, කඹුට
(5) සිතීම, කිපීම, ලිවීම, බැලීම (.....)

1.12 පහත සඳහන් වැකිවල **තද කළු අකුරෙන් මුද්‍රිත පද** අයත් **ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.

*කරව **පතා** නොවමින් මඳකුත් අලස

*මලේ බඹරු ලෙස පිරිවර ඇති **වේවා !**

*අත් ළෙල **දිදී** විදුලිය පබා

***ගනිති** උන් පුද පඬුරු දැහැමෙන්

(1) පෙරකිරිය, ආසිකිරිය, මුසුකිරිය, තෙකල් කිරිය
(2) තෙකල්කිරිය, මුසුකිරිය, ආසිකිරිය, පෙරකිරිය
(3) පෙරකිරිය, ආසිකිරිය, තෙකල් කිරිය, මුසුකිරිය
(4) පෙරකිරිය, මුසුකිරිය, ආසිකිරිය, තෙකල්කිරිය
(5) මුසුකිරිය, පෙරකිරිය, තෙකල්කිරිය, ආසිකිරිය (.....)

1.13 **උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) තොප, අප, මා, ඔවුහු
(2) තාපසයකු, පැවිද්දෙක්, යාචකයකු, තිරිසනෙක්
(3) වෙළෙන්දියක්, ගායිකාවක්, සිඟන්නියක, නළඟනක්
(4) ශිෂ්‍යයෝ, ඔවුන්, ගැමියෝ, ආගන්තුකයෝ
(5) හඬන්නෙක්, හඬන්නෝ, අපරාධකරුවකු. පක්ෂීහු (.....)

1.14 **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) අධිරාජ්‍ය, අධිකාරී, අධිවේගී, අධිබල
(2) නිරනුමාන, නිරපරාධි, නිර්පාක්ෂිත, නිර්භීත
(3) සම්මාන, සම්පූර්ණ, සම්බන්ධ, සංවාද
(4) අනුනායක, අනපේක්ෂිත, අනාරක්ෂිත, අනාවරණය
(5) පිළිතුර, පිළිසකර, පිළිමය, පිළිකෙව් (.....)

1.15 ''දිමුතු යසස් **වන් කුසුමසරාගේ - නුමුතු** සුවද මල් පැළඳ සරාගේ'' යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) විභක්ති, නිපාත, හා සමාස
(2) සමාස, විභක්ති, හා නිපාත
(3) නිපාත, සමාස. හා විභක්ති
(4) නිපාත, විභක්ති හා සමාස
(5) සමාස, නිපාත. හා විභක්ති (.....)

1.16 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන පදයක්** ඇති වරණය කුමක් ද?
(1) අතුරා, පතුරා, මතුරා, වපුරා
(2) බලත, යත, නටත, කියත
(3) විනා, මිස, මුත්, හැර
(4) වියවුල්, වීයැට, වියෝග, ව්‍යතිරේක
(5) ප්‍රාථමික, නාගරික, සංසාරික, කායික (.....)

1.17 **සමාස පදයක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.
(1) අසමගිය, අකුටිල, අසංවිධිත, සුකොමළ
(2) ජනපතිමැඳුර, ගිරාකූඩුව, මහිලාසමිතිය, ඇත්ගාල
(3) උණුවතුර, ගීසින්දු, අමරස, බස්නාහිර
(4) සුන්බත්, තුන්බිය, අවතීතිය, සඳවත
(5) තුන්දොර, ගල්හිත, පාපතර, ජීවනගමන (.....)

1.18 **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.

(1) නුවණැති, දකුණැස, දනැති, ඇදුරා
(2) නවහම්, මහණුවම්, ගුරුතුමා පිරියම්
(3) අතීන්ද්‍රිය, බුද්ධීන්ද්‍රිය, වස්තූපමා, සුරේන්ද්‍ර
(4) දෙයාකාර, නිරොද, දිනිසුරු, දෙවුර
(5) උනුන්. පිළිතුරු, එදිනෙදා, රනෝවිල (.....)

1.19 **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය** තෝරන්න.

(1) සමහරුන් ගී ගයද්දී ඇතැමෙක් නටුම් නටති.
(2) අප තුන් දෙනා නගරයට යමු.
(3) ඇදුරුතුමා ශිෂ්‍යයාගෙන් පිළිතුරු බලාපොරොත්තු වූහ.
(4) ඔවුන් සත්‍යය දකිත්වා !
(5) ගුරුවරයා ළමයෙක් කැඳවයි. (.....)

1.20 **වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත** වාක්‍ය තෝරන්න.

(1) ස්ත්‍රීවාචක ශබ්ද සාදාගැනීමේදී ක්‍රම කීපයක්ම අනුගමනය කරනු ලැබේ.
(2) නාමයකට හෙවත් ශබ්ද ප්‍රකෘතියකට ප්‍රත්‍ය එක් වීමෙන් පද සෑදේ.
(3) විවිධවූ අර්ථ සහිත පද එකතුවී ඒකාර්ථවත් පදයක් බවට පත්වීම සමාසවේ.
(4) විශේෂණ විශේෂණ දෙකක් සම්බන්ධවී සිදුවන සමාසය විශේෂණ සමාසය නම්වේ.
(5) නාමවිශේෂණ මෙන් නොව ක්‍රියා විශේෂණය වැකියෙහි කවරතැනක හෝ යෙදිය හැකිය. (.....)

# II කොටස

02. (අ) පහත සඳහන් ඡේදය කියවා **අසා ඇති ප්‍රශ්නවලට** පිළිතුරු සපයන්න.

දහවන වැනි ශතවර්ෂයේ දී අපගේ අසල්වැසි භාරතයේ නවකථා රචකයන්ගේ ද සමාජ ප්‍රතිසංස්කාරකයන් හා කුඩා දේශන පත්‍රිකා මුද්‍රණය කොට බෙදා හරින්නවුන්ගේ ද සැලකිය යුතු අවධානයක් දිනාගත් ප්‍රස්තුතයක් වූයේ තත්කාලීන භාරත සමාජයේ ස්ත්‍රියට හිමි ව තිබූ තැනයි. මේ තත්ත්වය මානව අයිතිවාසිකම් අරබයා උද්ගත වූ දැනුවත් භාවයේත්, පුද්ගල පෞරුෂ යනු ස්වෛරී ඒකකය යන සංකල්පයේත් එක්තරා පැතිකඩක් විදහා පායි. ස්ත්‍රී අධ්‍යාපනය සහ විධවාවන් මුහුණ පෑ ඛේදජනක ජීවන තත්වයෙන් ඔවුන් වඩාත් සහනදායී තලයකට නැංවිය යුතු ය. යන ස්ථාවරය, සමාජ ප්‍රතිසංස්කාරකයන්ගේ අවධානය දිනාගත් ප්‍රමුඛාංගයක් විය. බෙංගාලයේ ඊශ්වරචන්ද්‍ර විද්‍යාසාගර් නම් ප්‍රතිසංස්කාරකයා ළමා වැන්දඹුවන් නැවත විවාහ කර දීමේ සද්භාවය අවධාරණය කරමින් උද්යෝගීපරවශ දේශනමාලා පැවැත්වී ය. ඉන් නො නැවතී හැකිතාක් දුරට නිවැරදි යැයි තමා ඇදහූ දැය ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට ද හෙතෙම මහත් පරිශ්‍රමයක් දැරී ය. ඔහු ළමා වැන්දඹුවන්ට උරුම ව ඇති දුර්භාග්‍ය සම්පන්න ඉරණම අරඹයා ශකුන්තලා හා සීතාර්, බනාබස් මැයින් කෘති රචනා කිරීමට පෙළඹුණේ, පොදු පාඨක මනසෙහි තත්කාලීන ස්ත්‍රිය මුහුණ පා ඇති දුර්දශාව පිළිබඳ සංජානනයක් ජනිත කරවීමේ අභිප්‍රායයෙනි. ස්ත්‍රිය පිළිබඳ ව සැලකිල්ල සියලු ප්‍රාදේශීය භාෂාවන්ගෙන් රචිත සමකාලීන කෘතීන්ගෙන් ප්‍රකට කරයි.

(i) භාරත සමාජයේ ස්ත්‍රියට හිමි ව තිබු තැන පිළිබඳ උනන්දු වූවෝ කවරහු ද?

(ii) සමාජ ප්‍රතිසංස්කාරකයන්ගේ අවධානය දිනාගත් මූලිකාංගය වූයේ කුමක් ද?

(iii) ළමා වැන්දඹුවන්, වෙනුවෙන්, ඊශ්වරචන්ද්‍ර විද්‍යාසාගර් ගත් ක්‍රියාමාර්ග මොනවා ද?

(iv) ප්‍රාදේශීය භාෂාවන්ගෙන් රචිත සමකාලීන කෘතීන්ගෙන් කුමක් ප්‍රකට වේ ද?

(v) විවිධ කෘතීන් සම්පාදනයෙන් ඊශ්වරචන්ද්‍ර විද්‍යාසාගර් බලාපොරොත්තු වූයේ කුමක් ද? (ලකුණු 10යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන** සේ සාරාංශ කොට ලියා, සාරාංශ අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

වර්තාගත සාක්ෂිවලට අනුව දැනට සියවස් විසිපහකට පමණ පෙර ඇරැඹිණැ'යි උපකල්පනය කරන ලක්දිව ආර්ය ජනාවාස පිහිටුවීමත් සමඟ සිංහල ජාතියේ සම්භවයත් ඒ හා සමගාමී ව සිංහල භාෂාවේ සම්භවයත් සිදු වූ බව විශ්වාස කෙරෙයි. මෙසේ බිහි වූ සිංහල භාෂාව විවිධ මතවාද නිර්ණායක රාශියක් ඉදිරිපත් කෙරෙමින් විවිධ නයින් අධ්‍යයන සිදුවීම නූතනයේ දැකිය හැකි විශේෂ ප්‍රවණතාව යි. සිංහල භාෂාවේ සම්භවය කවදා සිදු වූයේ ද? සිංහල භාෂාවේ ව්‍යාකරණය හා වාක්කෝෂය කිනම් භාෂා කරන කොටගෙන පෝෂණ වූයේද? යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම ඒ අතර ප්‍රධාන වෙයි. කෙසේ වුව ද 19 වන සියවසේ සිට අනුක්‍රමයෙන් ශාස්ත්‍රීය හා විද්‍යාත්මක පදනමක් මත වර්ධනය වෙමින් පැවත ආ ඓතිහාසික වාග් විද්‍යාවත් සමඟ උක්ත ප්‍රශ්න කෙරෙහි වාස්තවික පිළිතුරු සොයා ගැනීමට වාග් විද්‍යාඥයින් සමත් වී ඇත.

යථෝක්ත පර්යේෂකයන්ගේ නිගමනවලට හා විද්‍යමාන භාෂා වාර්තා සාක්ෂිවලට අනුව සිංහල භාෂාව පැරණි ඉන්දු ආර්ය භාෂා සම්ප්‍රදායෙන් තත්භව වූවක් ලෙස පිළිගැනේ. සිංහලය හා ඉන්දු ආර්ය භාෂා අතර පවත්නා ශබ්ද නීතිගත සාම්‍යතාව මෙයට ප්‍රධාන සාධකය ලෙස ඔවුහු සඳහන් කරති. එහෙත් සිංහල භාෂාව විකාශනයෙහි එක් එක් අවස්ථාවල දී විවිධ භාෂා සම්ප්‍රදායවල ආභාසය ලැබී තිබෙන බව දැකගත හැකි ය. එසේ බල පෑ ප්‍රධාන භාෂාවක් ලෙස බොහෝ දෙනාගේ අවධානයට ලක් ව ඇත්තේ දෙමළ භාෂාවයි. දෙමල භාෂාව අංග කිහපයක් ඔස්සේ සිංහලයට බල පා තිබීම මෙයට හේතුවයි. භූ විස්තෘතිය වශයෙන් සිංහල භාෂාවට වඩාත් ආසන්නව දැක්නට ලැබෙන්නේ ද්‍රවිඩ භාෂා ගනයට අයත් භාෂා ය.

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව **වචන 300-350 වන සේ විශ්ලේෂණාත්මක** රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

1. ග්‍රාමීය ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ අවශ්‍යතාව
2. සංචාරක ව්‍යාපාරය දියුණු කර ගැනීමේ ක්‍රමෝපාය
3. ශ්‍රී ලංකාව පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන මත්ලෝලත්වය
4. ශ්‍රී ලංකාවට අනන්‍ය නොවූ ආහාර සංස්කෘතිය නිසා රෝගී වන ලාංකේය සමාජය.
5. රටේ අභිවෘද්ධිය පිණිස උගතුන්ගේ, බුද්ධිමතුන්ගේ ඒකරාශී වීම කාලීන අවශ්‍යතාවකි.
6. දිනෙන් දින ඉහළ යන රිය අනතුරු අවම කිරීමට නම් (ලකුණු 25යි)

04. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) බොහෝ සිංහලයන් බෞද්ධයෝ ය.
(ii) ඇතැම් මිනිස්සු කරන වැඩ යහපත් නොවේ.
(iii) ගංගාවන් වියළී ගියහොත් කුඹුරු විනාශ වනු ඇත.
(iv) අපි ශිල්ප නොදනිති'යි නොසිතන්න.
(v) දක්ෂ ලේඛිකාවක් වන්නේ කෙසේ ද? (ලකුණු 5යි)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) ගුත්තිල ඇදුරුතුමා මූසිල පරාජයට පත් කළේය.
(ii) බළධාරීහු ක්‍රීඩකයන් නොමග යැවූහ.
(iii) මහ නා මිහි සිසුන්ට තෑගි බෙදා දුන්නේ ය.
(iv) කලාකරුවෝ සමාජ සාධාරණත්වය උදෙසා සටන් කරති.
(v) ඕතොමෝ මනහර රැඟුම් පෑවා ය. (ලකුණු 5යි)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා **සුදුසු පදය** වරහන් තුළින් තෝරා ලියන්න.

(i) තව කෙනෙක් ඔහුට සම්බන්ධ (විය/වූහ)
(ii) ගංගා හා වැව් පිරී (යති/යයි)
(iii) (කාන්තාවෝ / කාන්තාවන්) දේශපාලනයට පැමිනීම මැනවි.
(iv) ගුරුවරයා (අපි/අප) බොහෝ දෙනා නො හඳුනයි.
(v) (තොපි/තොප) එනවා නම් අපි එහි නොයන්නෙමු (ලකුණු 5යි)

05. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල** අර්ථ විග්‍රහ කර ලියන්න.

(i) ඔහු සතු ධනස්කන්ධය **අසත්පථයේ** යෙදවීම නිසා දිළින්දක් විය.
(ii) **මෙරමා** දොස්ම දැකීම ඇතමෙකුගේ ගති ලක්ෂණයකි.
(iii) එතෙම දිවුල් ගසකට නැගී **නො විලික්සුණු** එල අනුභව කළේය.

(ලකුණු 1 x 3 = 3)

(ආ) පහත සඳහන් යෙදුම්වල **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) වරදට පෙළඹුණු පුද්ගලයකු නැවත නඟා සිටුවීම.
(ii) යමක සීමාව ඉක්වමා යාම
(iii) භාෂාවෙහි පද සැදී ඇති ආකාරය (ලකුණු 1 x 3 = 3)

(ඉ) පහත දී ඇති වාක්‍යවල හිස්තැනට **වඩාත් ම ගැළපෙන** පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) මතු පරපුරට .......................................... පවරා දීම මිනිසාගේ වගකීමකි.

(ii) සංචාරක ජීවිතයෙන් මිදී .......................................................... මානවයකු බවට පරිවර්තනය විය.

(iii) අතීත ගුරුවරයාගෙන් ඉගෙන ගත් පසු වන පොත් දී ශිල්පියව .......................................... කිරීම පිළිගත් චාරිත්‍රයකි.

(iv) කුමන කාර්යයක හෝ ...................................... කටයුතු කිරීම ඔහුගේ සිරිතකි.

(v) වරාය නගර සංවර්ධන ............................................. සඳහා ඇස්තමේන්තු සැකසේ.

(vi) සිදු වූ වංචා පිළිබඳ .......................................................... සඳහා කමිටුවක් පත් කෙරිණි. (½ x 6 = 03)

(තත්පරව, ව්‍යාපෘතිය, උපචාර, ස්ථිරවාසී, සංස්කෘතිය, විමර්ශනය) (ලකුණු 3යි)

(ඊ) තද කළු අකුරෙන් දක්වා ඇති බහු අර්ථ පද යොදා **<u>වෙනත් අරුතක් දෙන</u>** වාක්‍ය බැගින් තනන්න.

(i) බුදු දහම **කම්** සැප ඉවත ලයි.

(ii) කෙත් බිම් විශාල ප්‍රමාණයක් **පස්** පුරවා ගොඩකර ඇත.

(iii) ගැහැනිය ගමට යනු **වස්** බසයට නැගුණා ය.

(iv) මව තම දරුවා **කර** පින්නා ගෙන පෙරහැර පෙන්වයි.

(v) දියට **පැන** පිහිනීමට ඇතැම් බල්ලෝ ප්‍රිය කරති.

(vi) **පිය** පාර්ශවයේ නෑදෑයෝ විවාහයට එරෙහි වූහ. (ලකුණු 1 x 6 = 6)

06. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය** දක්වන්න.

(i) **ඓතිහාසික වාග්විද්‍යාඥයන්ගේ** මතය අනුව **යුරෝපීය** භාෂා කථා කළ ජනතාව වොල්ගා නිම්නයේ වාසය කර ඇත.
(ඓතිහාසික - තද්ධිත, වාග්විද්‍යාඥයන්ගේ - විභක්ති, යුරෝපීය - තද්ධිත)

(ii) **වෙදැදුරා වනෞෂධ සොයමින්** වනයට පිවිසියේ ය.
(වෙදැදුරා - සන්ධි, වනෞෂධ - සන්ධි, සොයමින් - ක්‍රියා)

(iii) පෙරදා **වට** වැස්සෙන් මහාමාර්ග ගංවතුරට යට විය.
(වට - කෘදන්ත, මහාමාර්ග- සමාස, ගංවතුරට - සන්ධි)

(iv) සුවිනීත ශිෂ්‍යයාගේ **හැසිරීම** දුටු **ගුරුවරු** සතුටු වූහ.
(**සුවිනීත** - උපසර්ග, හැසිරීම - කෘදන්ත, ගුරුවරු - විභක්ති)

(v) කම්කරුවෝ මාර්ගය පිළිසකර කරන්නට වහා කටයුතු කරත් ලූ
(කම්කරුවෝ - සමාස, වහා - නිපාත, ලූ - නිපාත) (ලකුණු 3x5 = 15)

07. (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් **ගැළපෙන ප්‍රස්තාව පිරුළ** ලියන්න.

(i) නිශ්ඵල උත්සාහයක් දැරීම.

(ii) සුළුවෙන් හෝ සමාන කළ නොහැකි.

(iii) ඉඩකඩ ඇති තැන ආයාසයෙන් ඇතුළු වීම.

(iv) යමෙකුට ප්‍රයෝජන ගත නොහැකි ලෙසට යමක් දීම.

(v) ලොකු අපරාධයක් කළ අයෙකුට සුළු අපරාධයක් කිරීම එතරම් අමාරු දෙයක් නොවේ. (½ x 6 = 03)

(vi) පමණ දැන කටයුතු කිරීම. (ලකුණු 3)

(ආ) පහත දී ඇති රූඪීවල **අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) හුඹස්බිය (ii) පාරම්බෑම (iii) මුළු සේසතම

(iv) ආලපාලුව (v) උරගා බැලීම (vi) තෙතබරි වීම (½ x 6 = 03)

(ලකුණු 3)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පද **සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) ලට්ට - ලොට්ට (ii) කන - කර (iii) හුරු - පුරුදු (½ x 6 = 03)

(iv) තක්කු - දුක්කු (v) ගමන - බිමන (vi) සට - කපට

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ** යෙදෙන පද ලියා දක්වන්න.

(i) කුදගනවා (ii) නිංගිරාව (iii) බාජ්ජ

(iv) හූරා (v) හොටින්දැ (vi) හොයනවා

(ලකුණු 3)

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාරයන්ට දියහැකි පොදු භාවිතයේ** යෙදෙන අරුත් ලියන්න.

(i) බඳැදිලි (ii) වලිකනවා (iii) පුරන්

(iv) දිදාලය (v) ඇගිට් (ලකුණු 3යි)

08. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දැන්අමුතුවැසාධනනිවෙනක්නැතඅලුතසාධාගතමනාගුණයෙක්නැතඅලුතැයටත්කොටගතමනාදෙවියෙක්බෞක්නැතහැමසත්හුමඅපනම්ඇසූඇසුතෙනැවැදපෙරළෙතිඇගින්රැස්ගියතෙනසාධුකාරදෙතිමුළුලොවකුලගැතිකොටවැඩසිටියෙම්මෙවිටදෙවියන්දුන්දිවඅහරවළඳායෙහෙන්නිඳාහිඳදවස්යවමියිනොසිතාරැදහවල්කවරක්හුදෙව්ලොවැලාලම්දෝකවරක්හුබඹලොවැලාලම්දෝහෝකවරක්හුඅමාමහනිවන්හිලාලම්දෝහෝකවරක්හුනිරාදුකින්ගලවම්දෝහෝකවරක්හුඅසුරකායෙන්ගලවම්දෝහෝකවරක්හුතිරිසන්දුකින්ගලවම්දෝහෝකවරක්හුප්‍රේතදුකින්ගලවම්දෝහෝයිම්නිස්ලොවින්දෙව්ලොවටදෙව්ලොවින්බඹලොවටබඹලොවින්නාලොවටනාලොවින්ගුරුළුවිමනටගුරුළුවිමනින්දඹදිවටදඹදිවින්ලක්දිවටලක්දිවින්දඹදිවටදිවෙමින්සතුන්පිණිසඇවිදනොවිඩාවදුක්ගත්බුදුන්සරණයෙමියිබුත්සරණයායුතුය.

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට. අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) ළ් + උ එක්වූ විට සෑදෙන අක්ෂර සහිත පදයක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(iii) ප්‍රේතදුකින් යන්නෙහි ස්වර ව්‍යඤ්ජන වෙන් කර ලියන්න.

(iv) දන්තජ ඝෝෂ මහාප්‍රාණයක් සහිත වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.

(v) කුශල + ය - කෞශල්‍ය නම් සමර්ථ + ය කෙසේ සකස් වේ ද? (ලකුණු 15යි)

## දෙවන වාර පරීක්‍ෂණය - 13 ශ්‍රේණිය 2018 - සිංහල I

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (අ)(i) විභක්තියකි, /අවධි විභක්තිය

(ii) ලී දඬු සහ කොළ කැපීම / ලී /ලැලි / කොළ කැපීම

(iii) මුළු ශරීරය ම කළු පැහැ ගැන්වී / මුළු ශරීරය ම නිල් පැහැ වී මියගොස් සිටීම.

(iv) දිරාපත්ව ගිය පැරණි ගසක/ දෙදණ, දෙවැලමිට බිම ඔබා බඩ යටින් තබා ගෙන (ලකුණු 4යි)

(ආ)(i) බෝධිසත්වයන් වහන්සේ පිළිබඳ පැහැදුන බැවින් / බෝධි සත්ත්වයන් වහන්සේ පිළිබඳ ප්‍රසන්න සිත් ඇති වූ නිසා

(ii) පළමුව වැඩිහිටියන් පිදීමේ / සැලකීමේ / ගරු කිරීමේ පිළිවෙත අනුගමනය නො කළ නිසා.

(iii) බාල මලණුවන් වෙනුවෙන් රජකම ලබාදෙන ලෙස.

(iv) හුදෙක් ම / ඉල්ලීම (ලකුණු 4යි)

(ඉ)(i) නිරෝගී බව / නිර්ව්‍යාධී බව

(ii) සමරැළි වැටුණු මහලු මිනිසෙකු

(iii) බෙහෙත් කැඳ ඉල්ලා ගෙන බී අසනීප සුවකර ගැනීම සඳහා

(iv) ව්‍යාධි - රෝග / ලෙඩ, ආශ්චර්ය - පුදුමය / විස්මය (ලකුණු 4යි)

(ඊ)(i) අහසෙහි බබළන කිරි සයුරේ රළපහර වැදීම නිසා

(ii) නෙළුම් විලකට (iii) පූර්ණ චන්ද්‍රයා

(iv) උදා දෙසෙන් - පෙරදිගින් / නැගෙනහිරින්/ඉන්ද්‍ර දෙසින්/ඉඳුරු දෙසින්
සරතස - වෙහෙස/විඩාව/මහන්සිය (ලකුණු 4යි)

(උ)(i) පන්සිය පනස් ජාතකපොතේ ඡද්දන්ත ජාතකයේ අන්තර්ගත පාඨයකි. සෝනුත්තර වැද්දාගේ හී පහර ලද ඇතු, වැටෙන්නට නොදී දරාගෙන සිටි මහා සුභද්‍රාවන්ගෙන් ඇය පමණක් සතුරා සොයා නොයන්නේ ඇයි දැයි අත්රජු ඇසූ අවස්ථාවේ මහා සුභද්‍රා විසින් ඇත් රජුට (ඡද්දන්ත හස්තිරාජයාට) පවසන ලද්දකි. (ලකුණු 2යි)

(ii) සද්ධර්මරත්නාවලියේ මච්ඡරිය කෝසිය සිටාණන්ගේ කථා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. මුගලන් හිමිගේ මැදිහත්වීමෙන් ලෝභී චේතනාව දුරු වූ සිටුවරයාට බුදුන් කරා යාමට මුගලන් හිමි කතා කරයි. එහි දී බුදුහු දැන් කොතැන දැයි සිටාණන් ඇසූ ප්‍රශ්නයට මුගලන් හිමි පිළිතුරු දුන් අවස්ථාව හා බැඳේ. (ලකුණු 2යි)

(iii) සද්ධර්මාලාංකාරයේ ආරඤ්ඤක අභය ස්ථවිර කථා වස්තුවෙහි අන්තර්ගත පාඨයකි. හරන්තික සොරාව අල්වාගත් උපාසක සොරාව දුර්වල කර මළමිනියක් තබා බැඳ අද රාත්‍රියෙහි ගමට අමනුෂ්‍යයෙක් එන බව පවසමින් උපාසක විසින් මෙම ප්‍රකාශය ගම්වැසියන්ට පවසන ලද්දකි. (ලකුණු 2යි)

(iv) මළගියඇත්තෝ නවකතාවෙන් උපුටාගත් පාඨයකි. තෝකියෝවේ කොකුසයි බුංකා ෂිංතොකයි පුස්තකාලයට ගිය දෙවොංදරාසංට අතර මගදී කලින් හඳුනාගත් ඇමරිකානු ස්ත්‍රියක් හමුවෙයි. එම අවස්ථාවේ දී එම ඇමරිකානු ස්ත්‍රිය විසින් දෙවොංදරාසංට පවසන ලද්දකි.

(ලකුණු 2යි)

(v) රත්නාවලී නාට්‍යයේ අන්තර්ගත පාඨයකි. සාගරිකා තමාගේ ම රත්නාවලී නැගණිය බව දැනගත් අවස්ථාවේ වාසවදත්තා බිසව විසින් සාගරිකා හට පවසන ලද්දකි.

(vi) පුරුද්ද කෙටි කතාවෙන් උපුටාගත් උද්ධෘතයකි. ලෙඩා සුවපත් කළ වලෙන්ති වෙදා ගෙදර යාමට සැරසුණු අවස්ථාවේ දී වෙද මහත්තයා ගමනට ලෑස්ති වෙලත් ඉවරයි යනුවෙන් ලෙඩාගේ මව ප්‍රකාශ කරයි. එහිදී වලෙන්ති වෙදා විසින් ලෙඩාගේ මවට ප්‍රකාශ කරන ලද්දකි.

(ලකුණු 2යි)

**2 ප්‍රශ්නයේ සිට 8 ප්‍රශ්නය දක්වා ප්‍රශ්නවලට සුදුසු උදාහරණ දක්වමින් අදාළ පිළිතුරු ලියා ඇති විට ඊට ගැළපෙන ලකුණක් පිරිනමන්න.**

## 13 ශ්‍රේණිය - සිංහල II

**<u>පිළිතුරු පත්‍රය</u>**

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. - 3 | 02. - 5 | 03. - 1 | 04. - 2 | 05. - 3 |
| 06. - 4 | 07. - 5 | 08. - 1 | 09. - 3 | 10. - 3 |
| 11. - 4 | 12. - 1 | 13. - 2 | 14. - 5 | 15. - 4 |
| 16. - 4 | 17. - 5 | 18. - 1 | 19. - 1 | 20. - 2 |

02. (අ) (i) නවකතා රචකයන්, සමාජ ප්‍රතිසංස්කාරකයන්, කුඩා දේශන, පත්‍රිකා මුද්‍රණය කර බොදහරින්නන්.
(කරුණු තුන ම ඇත්නම් ලකුණු 02 යි. කරුණු දෙකක් ඇත්නම් ලකුණු එකයි. එක් කරුණකට ලකුණු නැත)

(ii) ස්ත්‍රී අධ්‍යාපනය හා විධවාවන් මුහුණ පා ඇති බේදජනක තත්ත්වයෙන් ඔවුන් මුදවාගත යුතු බව.

(iii) වැන්දඹුවන් නැවත විවාහ කරදීම අවධාරණය කරමින් දේශන පැවැත්වීම.
ළමා වැන්දඹුවන්ට උරුම වූ දුර්භාග්‍ය ඉරණම අරබයා ග්‍රන්ථකරණයේ යෙදීම.
(කරුණු 02 ට ඇත්නම් ලකුණු 02 යි. එක් කරුණකට ලකුණු 01 යි.)

(iv) ස්ත්‍රීන් පිළිබඳ සැලකිල්ල

(v) ජනතාව තුළ තත්කාලීන ස්ත්‍රිය මුහුණ පා ඇති දුර්දශාව පිළිබඳ සංජානනයක් ජනිත කරවීම.

(ආ) * සිංහල ජාතියේත්, භාෂවේත් සම්භවය ආර්ය ජනවාස පිහිටුවීමත්, සමඟ ඇතිවීම. * සිංහල භාෂාව විවිධ න්‍යායන් මගින් අධ්‍යයනයක් නූතනයේ සිදුවීම.* 19 වන සියවසේ සිට වාග් විද්‍යාවත් සමඟ වාස්තවිත පිළිතුර සොයාගැනීම. * නූතන පර්යේෂණ අනුව සිංහල භාෂාව ආර්ය භාෂාවන්ගෙන් තත්භව වී ඇති බව.
* යම් අවස්ථාවල දී සිංහල භාෂාව විකාශනයෙහි විවිධ භාෂා සම්ප්‍රදායවල ආභාෂය ලැබී ඇති බව.
* දෙමළ භාෂාව සිංහලයට බලපා තිබීම.

ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතුය. ඡේද බෙදා ඇත්නම් ලකුණු 02 ක් අඩු වේ. වචන 60 -65 අතර තිබිය යුතු ය.

නියමිත වචන ප්‍රමාණය - ලකුණු 03 යි.
අක්ෂර වින්‍යාසයට - ලකුණු 04 යි.
අන්තර්ගතයට - ලකුණු 08 යි.

03. වචන සංඛ්‍යාව 300 - 350 අතර විය යුතු ය. වචන 400 ට වැඩි වේ නම් හෝ
25 ට අඩුවේ නම් හෝ ලකුණු 03 ක් අඩු කළ යුතු වේ.
වාක්‍ය රචනයට ලකුණු දීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

(i) ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශී වීම.
(ii) සංවිධානාත්මක බව
(iii) කරුණුවල පැහැදිලි බව
(iv) නිරවද්‍ය අක්ෂර වින්‍යාසය
(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම
(vi) භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
(vii) සුදුසු ලෙස ඡේද වෙන් කිරීම
(viii) පැහැදිලි අත් අකුරු
(ix) උපමා, රූපක, ආප්තෝපදේශය, ප්‍රස්ථාපිරුළු ගැන සැලකිලිමත් වන්න. සමස්ථයක් ලෙස ලකුණු පිරිනමන්න.

04. (අ) (i) බොහෝ සිංහලයෝ බෞද්ධයෝ ය.
(ii) ඇතැම් මිනිසුන් කරන වැඩ යහපත් නොවේවි
(iii) නිවැරදි වාක්‍යයකි.
(iv) අප ශිල්ප නොදනිති'යි නොසිතන්න.
(v) දක්ෂ ලේඛිකාවක වන්නේ කෙසේ ද?

(ආ) (i) ගුත්තිල ඇදුරුතුමා විසින් මූසිල පරාජයට පත් කෙරිණි / කරන ලදි / ලද්දේ ය. කරනු ලැබී ය / ලැබිණි / ලැබුණේ ය.

(ii) බලධාරීන් විසින් ක්‍රීඩකයෝ නො මග යවනු ලැබූහ / ලැබුවෝ ය යවන ලදහ / ලද්දාහ / ලද්දෝ ය / ලද්දාහු /යවනු ලැබුණු / ලැබුවාහු ලැබුණෝ ය.

(iii) මහ නා හිමි සිසුන්ට තැගි බෙදා දෙන ලදි /ලද්දේ ය / දෙනු ලැබී ය. / දෙනු ලැබිණි / ලැබුණි.

(iv) කලාකරුවන් විසින් සමාජ සාධාරණත්වය උදෙසා සටන් කෙරෙයි/ කරනු ලබයි / කරනු ලැබෙයි/ කරනු ලැබේ.

(v) ඇය විසින් නහනර රැගුම් පාන ලදි / පානු ලැබිණි / පානු ලැබුණි.

ඉ) (i) විය (ii) යයි (iii) කානතාවන් (iv) අප (v) තොප

05. (අ) (i) වැරදි මාර්ගයේ

(ii) අනුන්ගේ (iii) නොඉදුණු /අමු

(ආ) (i) පුනරුත්ථාපනය (ii) අතික්‍රමණය (iii) නිරුක්තිය

(ඉ) (i) සංස්කෘතිය (ii) ස්ථිරවාසි (iii) උපචාර (iv)තත්පර ව

(v) ව්‍යාපෘතිය

(ඊ) කම් / කාමය - කර්මය - කර්ම විභක්තිය - කැමැත්ත - අනංගයා - වැඩ

පස් / පාංශු - පහ - පුත්‍ර - උගුල - පාසය - මූත්‍රා

වස් - පිනි - වර්ෂ - වස්කාලය

කර - දැළිපිහිය - කර වූ - කර කර ශබ්දය - අත්ල - විධික්‍රියාව/ කර නම් වූ ගස

පැන - ප්‍රශ්නය - ජලය - විධික්‍රියාව

පිය - පියා - පියාපත්, කැමති, පාද, වසා ගැනීම, වැසීම, තටු

06. (i) ඓතිහාසික - එයට අයත් යන අර්ථයේ තද්ධිත / සම්බන්ධාර්ථයෙහි තද්ධිත

වාග් විද්‍යාඥයන්ගේ - සම්ප්‍රදාන විභක්ති

යුරෝපීය - එහි උපන්නේ යන අර්ථයෙහි තද්ධිත

(ii) වෙදැදුරා - පූර්වස්වර ලෝප සන්ධිය

වනෞෂධ - පූර්වස්වර ලෝප සන්ධිය

සොයමින් - මිශ්‍ර ක්‍රියා

(iii) වට - අතීත කෘදන්ත / අතීතකාල කර්තෘකාරක කෘදන්ත

මහාමාර්ග - විශේෂ සමාසය / විශේෂණ පූර්වපද සමාසය

ගංවතුරට - ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය

(iv) සුවිනීත - අධිකාර්ථයේ / මනා ලෙස අර්ථයේ උපසර්ග

හැසිරීම - භාවකාරක කෘදන්ත

ගුරුවරු - ප්‍රථමා විභක්ති

(v) කම්කරුවෝ - කර්ම විභක්ති සමාසය

වහා - ශීඝ්‍රාර්ථයේ නිපාත

ලු - ශ්‍රැති සූචනාර්ථයේ නිපාත

07. (අ)(i) කුනිස්සන්ට දැල් දැම්මා වාගේ / අහසට ඉණි මං බැන්දා වගේ / ගඟට ඉණි කැපුවා වගේ

(ii) අලගු කියන්ටත් බැරි ලෙසට

(iii) දෙගල් අස්සේ බිජු දැමීම වගේ

(iv) බල්ලන්ට ලෙලි පොල් දෙනවා වගේ

(v) වෙහෙරක් ගිල්ල එකාට පිළිමය කජ්ජක් ද?

(vi) ඇඟිල්ලෙ තරමට ඉදි මෙන්න ඕනලු.

(ආ)(i) බොරුබිය (ii) අවස්ථාව ලැබෙනතුරු ලැබීම

(iii) සියලු වස්තුව (iv) හානිය

(v) උත්සාහ කිරීම. (vi) හොඳටම තෙමීම

(ඉ)(i) පද දෙකම අර්ථ විරහිත යුගල පද (ii) මුල් පදයට සමීප අර්ථයක් සහිත යුගල පද

(iii) මුල් පදයට සමාන අර්ථයක් සහිත යුගල පද

(iv) පද දෙකෙහි ම අර්ථ රහිත යුගල පද

(v) මුල්පදය අර්ථ සහිත පසු පදය අර්ථවිරහිත යුගල පද

(vi) පද දෙක ම එක ම අර්ථයේ ඇති යුගල පද

(ඊ)(i) නිදාගන්නවා (ii) අපහාසය (iii) බාදිය

(iv) මස්සිනා / මහතා (v) මැහැල්ල (vi) හෙවිල්ලනවා

(උ)(i) දෙඅත් එක්කොට

(ii) යමක් කිරීමට බොහෝ වෙහෙසවීම

(iii)කුඹුරු වගා නොකර අත්හැරීම

(iv)ඉදිකටුවෙන් අතින් මසනවිට ඇඟිල්ල ආවරණය වන පරිදි දමන කොපුව

(v) අඩක් බොල් වූ වී

08. (i) දැන් අමුතු වැ සාධන නිවනෙක් නැත. අලුතැ සාධාගත මනා ගුණයෙක් නැත. අලුතැ යටත් කොට ගත මනා දෙවියෙක් බඹෙක් නැත. හැම සත්හු ම අප නම් ඇසූ - ඇසූ තෙනැ වැඳ පෙරළෙති, ඇගින් රස් ගිය තෙනැ සාධුකාර දෙති, මුළු ලොව කුලගැති කොට වැඩ සිටියෙමි. මෙවිට දෙවියන් දුන් දිව අහර වළඳා යෙහෙන් නිදා හිඳ දවස් යවමි'යි නොසිතා, රෑ දහවල් ''කවරක්හු දෙව්ලොවැ ලා ලම් දෝ? කවරක්හු බඹ ලොවැ ලා ලම් දෝ හෝ? කවරක්හු අමා මහ නිවන්හි ලා ලම් දෝ හො? කවරක්හු නිරා දුකින් ගලවම් දෝ හෝ කවරක්හු තිරිසන් දුකින් ගලවම් දෝ හෝ? කවරක්හු ප්‍රේත දුකින් ගලවම් දෝ හෝ යි. මිනිස් ලොවින් දෙව්ලොවට, දෙව්ලොවින් බඹලොවට, බඹලොවින් නාලොව නාලොවින් ගුරුළුවිමනට, ගුරුළුවිමනින් දඹදිවට, දඹදිවින් ලක්දිවට, ලක්දිවින් දඹදිවට, දිවෙමින් සතුන් පිණිස ඇවිදැ නො විඩාව දුක් ගත් බුදුන් සරණයෙමි'යි බුත්සරණ යා යුතු''

(විරාම ලකුණු ලකුණු 4යි, පද බෙදීම ලකුණු 3යි)

(ii) ගුරුළු

(iii) ප් + ර් + ඒ + ත් + අ + ද් + උ + ක් + ඉ + න්

(iv) සාධන

(v) සාමාර්ථ්‍ය (ලකුණු 2 x 4 = 8)